මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

**මාධ්‍ය නිවේදන අංක :PRE/2024/85** **2024.09.17**

## ජනාධිපතිවරණය - 2024 සැප්තැම්බර් 21

### ජනාධිපති ධූර අපේක්ෂක අයිඩෲස් මොහමදු ඉල්යාස් මහතාගේ මියයාම

2024 සැප්තැම්බර් 21 වැනි දින පැවැත්වීමට නියමිත ජනාධිපතිවරණය සඳහා 2024.08.15 දින නාමයෝජනා කරන ලදුව, අංක 2397/51 හා 2024.08.15 දින දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙන් ජනාධිපතිධූර අපේක්ෂකයෙකු ලෙස ප්‍රසිද්ධියට පත් කරන ලද, අයිඩෲස් මොහමදු ඉල්යාස් මහතා 2024.08.22 දින මිය ගොස් ඇත.

එම මරණය සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාව සෑහීමකට පත් වීම මත, එම අපේක්ෂකයා නාමයෝජනා කළ තැනැත්තා වන කේ.එම්.එන් සංජය සම්පත් රේමන් මහතා වෙත, වෙනත් අපේක්ෂකයෙකු නාමයෝජනා කරන ලෙස, 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ 22(1) උපවගන්තිය අනුව විධාන කරන ලද අතර, ඔහු විසින් එම විධානයේ දින සිට දින තුනක් ඇතුළත වෙනත් අපේක්ෂකයකු නාමයෝජනා කිරීම පැහැරහැර ඇත.

එහෙයින් පනතේ 22(1) (ආ) උප වගන්තිය අනුව ඡන්ද පත්‍රිකාව සහ ඡන්ද විමසීමට අදාළ සෙසු සියලු ලේඛනවලින් මියගිය අපේක්ෂකයාගේ නම ඉවත් කරනු ලැබ ඇත්තාක් මෙන් සලකනු ලබන බවත්, අයිඩෲස් මොහමදු ඉල්යාස් මහතාට ඡන්දය ලකුණු කර ඇත්නම් එය ප්‍රතික්ෂේප කරනු ලැබිය යුතු ඡන්ද පත්‍රිකාවක් ලෙස සලකා කටයුතු කරන බවත් නිවේදනය කරනු ලැබේ.

**ආර්.එම්.ඒ.එල්.රත්නායක**
සභාපති, මැතිවරණ කොමිෂන් සභාව
(මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙනි)